# අධ්‍යාපන අමාත්‍යාංශය

සීමිත පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේ
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02
සේවා ගණයේ සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි තනතුරට
බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2024

01. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුවේ 2022.11.10 (හයවන රැස්වීම) දිනැති වාර්තාව අනුව හා අංක අමප/22/2034/605/011-II දරන හා 2022.12.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/02/-07/02/2018 හා 2023.03.27 දිනැති ලිපියද අනුව මෙම අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි පුරප්පාඩු සඳහා 80 දෙනකු සීමිත පදනම මත උසස් කිරීම මගින් පත්කරනු ලබන අතර ඒ සඳහා පවත්වනු ලබන විභාගය **2024 ජූලි මස 13 දින** කොළඹ දී පවත්වනු ලැබේ.

02. 2016.02.25 දිනැති හා අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN1 - 2016 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 27,140-300x10 -350 x 11- 495 x 10 -660 x 10 - රු. 45,540ක් වේ.

03. ඇගයීම් ක්‍රමවේදය :-

සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු සඳහා 80 දෙනෙකු සීමිත පදනම මත බඳවාගැනීම සිදු කරපුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන විෂයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 40ක් බැගින් ලබා සමත් විය යුතුය. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ.) ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබා දෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

| | මුළු ලකුණු |
|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය)<br>(කාලය පැය 01) | 100 |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය)<br>(කාලය පැය 01) | 100 |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 |

3.1. ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තර
මෙම ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. මෙම ලිඛිත පරීක්ෂණය **2024 ජූලි මස 13 කොළඹ දී** පවත්වනු ලැබේ.

I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100)

සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි (පිරිමි)/ සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි (ගැහැණු) තනතුරට අදාළ රාජකාරි, නේවාසික සිසුන්ගේ විනය, ආරක්ෂාව, සුහසාධනය හා ආහාර සැපයීම යන කටයුතු කරගෙන යාම හා එම කටයුතු ඉටුකරලීමේදී ශිෂ්‍ය නිවාස අධිකාරිට සහාය දැක්වීම, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සුහසිද්ධිය, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාරකරු ලෙස කටයුතු කිරීම, ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ පොත්පත් ලේඛන පවත්වාගෙන යාම, මිල දී ගැනීම, ආරක්ෂා කිරීම හා නිකුත් කිරීම පිළිබඳ කටයුතු, ආහාර පාන පිසීම පිළිබඳ පරීක්ෂා කිරීම, මුළුතැන් ගෙයි මෙවලම් පිළිබඳ පවිත්‍රතාව, නේවාසිකාගාරය පිරිසිදුව තැබීමට විධිවිධාන යෙදීම, රෝගාතුර වූ සිසුන් පිළිබඳ කටයුතු, රජය සතු දේ ආරක්ෂා කිරීම පිළිබඳ කටයුතු,පවිත්‍රතාව පවත්වාගෙන යාමට අදාළ කටයුතු, ආහාර පාන පිළියෙළ කිරීම පිළිබද කටයුතු, ආහාර ගන්නා අවස්ථාව පිළිබඳ අධීක්ෂණ කටයුතු, නේවාසිකාගාරවල ජලය, විදුලිය විධිමත්ව සැපයීමට අදාළ කටයුතු, නේවාසිකයින් නේවාසිකාගාරයෙන් බැහැරවීම හා පැමිණීම පිළිබඳ කාර්යයන් හා තනතුරට අදාළ ආයතන ප්‍රධානීන් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100)

අපේක්ෂකයින්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

3.2. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50)
ඉහත සඳහන් කරන ලද පරීක්ෂණ මණ්ඩලය විසින් 3.2.1 යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි. මෙහිදී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

3.2.1. අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබාදීමේ පටිපාටිය - 2023

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු | |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i. අ.පො.ස (සා.පෙළ) | ● විශිෂ්ට සාමර්ථ්‍ය - එක් විෂයකට ලකුණු 02 බැගින්<br>● අධි සම්මාන - එක් විෂයකට ලකුණු 01 බැගින්<br>● සම්මාන - එක් විෂයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ්‍ය ලබා තිබීමට අමතරව ) | 10 | 15 |
| ii. අ.පො.ස (උ.පෙළ) | ● විශිෂ්ට සාමාර්ථ්‍ය- එක් විෂයකට ලකුණු 2 බැගින්<br>● අධි සම්මාන- එක් විෂයකට ලකුණු 1 බැගින්<br>● සම්මාන - එක් විෂයකට ලකුණු 0.5බැගින් | 5 | |
| iii. උපාධි | | 15 | |
| 02. සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකට ම ලකුණු 02 බැගින් | 15 | 15 |
| 03.පරිගණක හැකියාව<br>■ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | 5 |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මගින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | 5 |
| | අ.පො.ස. (උ.පෙළ) විෂයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (1 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br>● තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | 5 |
| | ඇගයීම් එක් ලිපියකට - එක ලකුණ බැගින්<br>● තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | 5 |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.)

04. මේ සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය 2024 ජූලි මස 13 කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත.

05. සුදුසුකම්:-

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන හා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් තනතුරුධාරීන්ට සීමිත පදනම මත සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට අයදුම් කිරීමට,

(අ) අධ්‍යාපන සුදුසුකම්: -

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී මව් භාෂාව, ගණිතය යන විෂයන් සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත් තිබිය යුතුය.

(ආ) පළපුරුද්ද : -

නියමිත දිනට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ) වෙනත් සුදුසුකම්:-

I. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතුය.

II. යම් තනතුරක ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති වීම.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබීම.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

06. ඉල්ලුම් කිරීමේ ක්‍රමය: -

(අ) අයදුම්පත මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම යොදා ගනිමින් අපේක්ෂකයා විසින් ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමු පිටුවට ද 05 සිට 09 තෙක් දෙවන පිටුවට ද 10 සිට 14 තෙක් තෙවන පිටුවට ඉතිරිය සිව්වන පිටුවට ද ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අදාළ අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) ලිඛිත පරීක්ෂණය සිංහල සහ දෙමළ යන භාෂාවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට තමන් සේවයට බැඳුණු භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අයදුම්පත සකස් කිරීම හා සම්පූර්ණ කිරීම කළ යුත්තේ තමන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන භාෂා මාධ්‍යයෙන්මය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්පත පිළියෙලකර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කළ අයදුම්පත් ජාතික පාසලක, ගුරු මධ්‍යස්ථානයක හෝ ගුරු විද්‍යාලයක සේවය කරන අයදුම්කරුවකු නම් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ද විද්‍යාපීඨයක සේවය කරන අයදුම්කරුවකු නම් පීඨාධිපති මගින්ද ලියාපදිංචි තැපෑලෙන් 2024.03.25 දින හෝ එදිනට පෙර ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ 1503,
කොළඹ.

යන ලිපිනයට එවිය යුතුයි. අයදුම්පත් එවීමේ දී ඒවා බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සීමිත පදනම මත සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට බඳවා ගැනීමේ විභාගය - 2024" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඈ) නිලධාරීන් විසින් සම්පූර්ණකර ඉදිරිපත් කරන අයදුම්පත් තම කාර්යාලයට ලද දිනයේ දී ම කාර්යාලයීය දින මුද්‍රාව තබා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, සහතික කළ දිනය ද සහිතව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ඉහතින් දක්වන ලද ලිපිනයට ලැබෙන සේ ජාතික පාසල් විදුහල්පතිවරුන්/ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්/ගුරු මධ්‍යස්ථාන කළමණාකරුවන් විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් යොමු කිරීමට කටයුතු කළ යුතු අතර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සේවයේ නියුතු වූවන් පීඨාධිපති මගින් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ) සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා මුදාහරිනු ලැබ ඇති / සේවය සඳහා ද්විතීයනය කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අයදුම්පත් සහතික කොට ඉහත දැක්වෙන ආකාරයට එවිය යුතුයි.

(ඊ) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාදවන හෝ නැතිවන අයදුම්පත් පිළිබඳව ද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත් පිළිබඳව ද පැමිණිලි සලකා බලනු නොලැබේ.

(උ) ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය මේ සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධයෙන් සිදුවන වෙනස්වීම් කිසිවක් සලකා බලනු නොලැබේ.

07. විභාග ගාස්තු:-

විභාග ගාස්තුව රු. 600/= කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට/දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. අයදුම්කරුවන්ගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදුකරනු නොලැබේ.

08. විභාගයට ඇතුළත්වීම : -

(අ) ලිඛිත පරීක්ෂණය සඳහා වන අයදුම්පත පිළිගත් සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ දී එහි ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ආ) විභාග අපේක්ෂකයින් තමන්ට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතෙහි පිටපත ද අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර සඳහන්කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(ඈ) ලිඛිත පරීක්ෂණයේ ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් පරීක්ෂණ මණ්ඩලය ලබා දෙන ලකුණුවල මුළු එකතුව අනුව කුසලතා අනුපිළිවෙළට සකස්කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. එසේ ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම් කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) විභාග කොමසාරිස් ජනරාල් විසින් ලබා දුන් අවසාන ප්‍රතිඵල ලේඛනය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත.

*සටහන* :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත්කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතුය. එසේම තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. **සාවද්‍ය තොරතුරු සැපයීම් සඳහා දඬුවම්ː -**

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට ඊට පෙනී සිටීම නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. **පත්වීම් සඳහා තෝරා ගැනීම ː -**
යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ලිඛිත පරීක්ෂණයෙන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව අනුගමනය කරමින් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව තෝරා ගනු ලැබේ. (ලිඛිත පරීක්ෂණය සඳහා අවම ලකුණු 40ක් ලබා ගැනීම අනිවාර්ය වේ. එසේම අවම ලකුණු 40ක් ලබා නොගන්නා අයදුම්කරුවන් මෙම පත්වීම සඳහා සුදුස්සන් නොවේ.)

12. විභාගයෙන් සමත්වන යම් අපේක්ෂකයකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපවත්වන රෙගුලාසි හා විධිවිධාන යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම් කරණකොට ගෙන පත්වීම් නොදීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

13. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීම ද අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

14. මෙම දැන්වීමේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

වසන්තා පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.